ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2017 පෙබරවාරි 27 යොමු අංකය 1617-033

හිතවත් දෙමාපියන් වෙත,

**දහම් පාසලේ නඩත්තු කටයුතු සහ අලුත්වැඩියා කිරීම සඳහා ඔබගේ සහයෝගය**

ඔබගේ දහම් පාසල දැන් වරු තුනකින් සමන්විත වී, 600කට වැඩි දරුවන් ප්‍රමාණයක් අධ්‍යාපනය ලබන ආයතනයක් බවට පත්වී ඇත. මේ නිසා දහම් පාසල පවත්වාගෙන යාමේදී එහි ගොඩනැගිලි, විදුලි උපකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර ආදිය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම විධිමත්ව කරගෙන යාම සඳහා ඒ පිලිබඳ දැනුමක් ඇති සහ එම වැඩ කටයුතු කරවීමට හැකියාව ඇති දෙමාපියන්ගේ සහයෝගය අවශ්‍ය වී ඇත.
නඩත්තු සහ අලුත්වැඩියා කිරීමේ වැඩ

1. වායු සමීකරණ යන්ත්‍ර
2. විදුලි පද්ධතිය සහ ආලෝකනය
3. ශබ්ද විකාශන යන්ත්‍ර
4. ජල නල වැඩ
5. මේසන් වැඩ, වඩු වැඩ සහ තීන්ත ආලේප කටයුතු
6. ගිනි නිවන උපකරණ
7. ගිනි නිවන උපකරණ, ඉවත් කිරීමේ සහ ආරක්ෂක සැලසුම් සකස් කිරීම

ඉහත සඳහන් වැඩ කටයුතු සඳහා සහයෝගය දීමට හැකියාවන් ඇති දෙමාපියන් කරුණාකර ඔබට ලබාදිය හැකි අංශයන් පිළිබඳව සඳහන් කර අපගේ email ලිපිනයට (Dhahampasala@gmail.com) දැනුම් දෙන්න. නැතිනම් අපගේ සංවිධායක කමිටුවේ සාමාජික මහතෙකු හමුවන්න.

ඔබගේ දහම් පාසලේ ගොඩනැගිලි විධිමත්ව පවත්වාගෙන යාම ඔබගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා උපකාර වන බව කරුණාවෙන් සලකන්න.

ස්තුතියි,

සංවිධායක කමිටුව
ඩුබායි දහම් පාසැල